# 5.2.1 ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ගැටලු



## ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ගැටලු

ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ප්‍රධාන ගැටලු කිපයක් හඳුනා ගත හැකිය.

- ආර්ථික
- සමාජීය
- පාරිසරික

වශයෙන් එම ගැටලු කොටස් තුනකට බෙදා දැක්විය හැක.ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ගැටලු වඩාත් හොඳින් හඳුනා ගත හැක්කේ කොළඹ හා ඒ අවට නගර ආශ්‍රිතවය. ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ගැටලු බොහෝ විට වෙන් කර හඳුනා ගැනීම දුෂ්කරය. ඊට හේතුව එක් ගැටලුවක් හා අනෙක් ගැටලු සම්බන්ධව පවතින බැවිනි.කෙසේ වෙතත් මෙම ගැටලු වෙන වෙනම ගෙන අධ්‍යයනය කිරීමට උත්සාහ කරමු.







Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ගැටලු

| ආර්ථික | සමාජීය | පාරිසරික |
|---|---|---|
| • දරිද්‍රතාව<br>• විරැකියාව<br>• ඉඩම් මිල ඉහළ යාම<br>• අධික ජීවන බර<br>• ආදායම් බෙදී යාමේ විෂමතාව | • ජනාවාස ගැටලුව<br>• මන්දපෝෂණය<br>• ජල විදුලි පහසුකම් හිඟය<br>• ජාතිවාදී හා පන්තිභේද ගැටලුව<br>• සෞඛ්‍ය ගැටලු<br>• සංස්කෘතික පරිහානිය<br>• සමාජ පරිහානිය | • ජල දූෂණය<br>• වායු දූෂණය<br>• ශබ්ද දූෂණය<br>• ගොඩබිම් දූෂණය<br>• රථවාහන තදබදය<br>• ඝන අපද්‍රව්‍ය එකතු වීම |

## ආර්ථික ගැටලු

නාගරීකරණය ආශ්‍රිත ප්‍රධාන ගැටලුවක් වන්නේ ආර්ථික ගැටලුය.විශේෂයෙන්ම කොළඹ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික ගැටලු බහුලය. නගරයේ දියුණු වූ ප්‍රදේශ මෙන්ම අඩු පහසුකම් සහිත ප්‍රදේශද දැකිය හැක.අඩු පහසුකම් සහිත ප්‍රදේශ ආශ්‍රිතව මුඩුක්කු පැල්පත් ව්‍යාප්තව ඇත. මේ නිවාසවල ජීවත් වන ජන කණ්ඩායම් දරිද්‍රතාවය නිසා පීඩාවට පත්ව සිටිති.ඔවුන්ට ස්ථිර රැකියාවක් නොමැත.වෙළදාම, සමාජ විරෝධී රැකියාවල ඔවුහු යෙදී සිටිති.ඒ නිසා ලබන ආදායම ද ස්ථිර නැත. එය නාගරික දරිද්‍රතාවයට හේතුවක් වී ඇත.නාගරික ප්‍රදේශවල ඉඩම් මිල ඉතා ඉහළය. ඊට හේතුව පවතින අඩු ඉඩම් ප්‍රමාණයට ඇති ඉල්ලුම ඉතා ඉහළ බැවිනි.

එසේම විරැකියාව නාගරික ප්‍රදේශ ආශ්‍රිතව දැකිය හැකි ප්‍රබල ආර්ථික ගැටලුවකි. විශේෂයෙන් ම පැල්පත්වාසී ජනතාව මෙම ගැටලුවට තදින් ම මුහුණ පා සිටිති. ඔවුන්ගේ තරුණ ප්‍රජාවගෙන් 60% ක් පමණ විරැකියාවෙන් පෙළෙන බව කියනු ලැබේ.නගරයක දියුණු ජන කණ්ඩායමක් ද වාසය කරන අතර  ආදායම් බෙදියාමේ විෂමතාව තදින් ම බලපවත්වන ගැටලුවකි.





අන්තර්ගතය :- එච්.ජී.ඉන්ද්‍රා කුමාරි , ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණි කරුණාසේන මිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සමාජීය ගැටලු

නගරයක් යනු ඉතා කුඩා ප්‍රදේශයකි. එම කුඩා ප්‍රදේශයට විශාල ජන සංඛ්‍යාවක් ඒකරාශි වීම නිවාස ගැටලුව උග්‍ර වීමට හේතුවක් වී ඇත.විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල් ජීවත් වන පැල්පත් හා මුඩුක්කු ආශ්‍රිතව නිවාස හා ජනාවාස ගැටලුව උග්‍රව පවතී.මුඩුක්කු හා පැල්පත් ඉදි කොට ඇත්තේ ජීවත්වීමට පවා නුසුදුසු ප්‍රදේශවලය.දුම්රිය මාර්ග,මහාමාර්ග,ගංගා දෙපස නිතරම ජලයෙන් යටවන පහත් ප්‍රදේශවල බොහෝ විට මෙම පැල්පත් නිවාස ඉදි කොට ඇත.





මෙම මුඩුක්කු පැල්පත් සමහර විට වර්ග අඩි 100 -125 වන අතර ඉටිරෙදි ,තහඩු ,ලෑලි ආදි ද්‍රව්‍ය යොදා ඉදිකර ඇත. මෙම කුඩා වපසරිය තුළ හය දෙනෙකුට වඩා ජීවත් වන අවස්ථා ඇත.1998 කරන ලද පරීකෂණයකට අනුව කොළඹ නගරය තුළ අඩු පහසුකම් සහිත ජනාවාස 1506 ක් තිබී ඇත. වර්තමානය වන විට මෙය ඉහළ අගයක්ව ඇත.

නාගරික ප්‍රදේශවල අඩු පහසුකම් සහිත නිවාස ඇති ප්‍රදේශවල බෝවන රෝග බහුලව ව්‍යාප්ත වේ. නාගරික ප්‍රදේශවල පරිසර දූෂණය හේතුවෙන් ද ක්‍රියාකාරී බව අඩු වීම ,ආහාර පුරුදු , අධික දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතය බෝවන රෝග මෙන්ම බෝ නොවන රෝග බහුලව ව්‍යාප්ත වන ආකාරය දැක ගත හැකි ය.

අන්තර්ගතය :- එච්.ජී.ඉන්ද්‍රා කුමාරි , ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණි කරුණාසේන මිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්ත වන රෝග තත්වයන්

### බෝවන රෝග

- කොළරාව
- බරවා
- ඩෙංගු
- පාචනය
- පණුරෝග



### බෝ නොවන රෝග

- පෙනහලු ආශ්‍රිත රෝග
- චර්ම රෝග
- හෘද රෝග
- පිළිකා
- දියවැඩියාව
- අම්ල පිත්ත රෝගය

විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල් අතර විවිධ සමාජීය ගැටලු රාශියක් නිර්මාණය වී ඇත.ඔවුන් අතර පවතින විරැකියා තත්ත්වය නිසාම විවිධ සමාජ අසම්මත රැකියාවල යෙදීම දැකිය හැකිය.

- අවිධිමත් වෙළදාම
- අනවසර වෙළදාම
- ගණිකා වෘත්තිය
- ගැට කැපීම
- මත් ද්‍රව්‍ය අලෙවිය
- සිඟා කෑම

මේ අතර ප්‍රධාන වේ. එසේම නාගරික ප්‍රදේශවල ඇති නැති පරතරය මහත් සේ දැකිය හැකි ය. දියුණු ප්‍රදේශ දියුණු ජන කණ්ඩායම් මෙන්ම නොදියුණු ප්‍රදේශ හා නොදියුණු ජන කණ්ඩායම් ද නාගරික ප්‍රදේශවල දැකිය හැකි ය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එච්.ජී.ඉන්ද්‍රා කුමාරි , ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණී කරුණාසේන මිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පාරිසරික ගැටලු

ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ගැටලු ගැන අවධානය යොමු කරන විට පාරිසරික ගැටලු ප්‍රධාන වේ. කොළඹ නගරය මුල් කරගෙන ශ්‍රී ලංකාවේ නාගරීකරණය වර්ධනය වී ඇති බැවින් නාගරීකරණ ගැටලු හඳුනා ගත හැක්කේ ද කොළඹ නගරය මුල් කරගෙන ය. කොළඹ නාගරික ප්‍රදේශය තුළ ප්‍රධාන පාරිසරික ගැටලුවක් වන්නේ පරිසර දූෂණයයි. ඒ අතර වායු දූෂණය ප්‍රබල වේ.කොළඹ නගරය තුළ ව්‍යාප්තව ඇති කර්මාන්තශාලාවලින් ද ප්‍රවාහන කටයුතු නිසා ද පරිසරයට මුදා හැරෙන කාබන්ඩයොක්සයිඩ් , කාබන් මොනොක්සයිඩ් , ඊයම් වැනි විෂ වායු ප්‍රමාණය ඉතා අධිකය. කොළඹ නගරය වෙත දිනකට වාහන 250000 කට වැඩි ප්‍රමාණයක් පැමිණෙන බව කියනු ලැබේ. මෙමඟින් වායු දූෂණය පමණක් නොව ශබ්ද දූෂණය ද සිදුවේ.





ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල කැලි කසළ එකතු වීමද ප්‍රබල පාරිසරික ගැටලුවකි.කොළඹ නගරය ආශ්‍රිතව දිනපතා එකතුවන කුණු කසළ ප්‍රමාණය ඉවත් කිරීම විශාල ගැටලුවකි. කොළඹ නගරය තුළ එකතු වන කුණු කසළ ඉවත් කිරීම ප්‍රබල සමාජීය හා දේශපාලනික ගැටලුවක් වූ ආකාරය පසුගිය කාලයේ අපි දුටුවෙමු. කුණු කසළ එකතු වීම පරිසරය අපවිත්‍ර වීමට හේතුවක් වේ.එමඟින් විවිධ ලෙඩ රෝග සෑදීමේ ඉඩකඩ වැඩි ය.





අන්තර්ගතය :- එච්.පී.ඉන්ද්‍රා කුමාරි , ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණි කරුණාසේන මිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අභ්‍යාසය

(1) ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ආර්ථික හා සමාජීය ගැටලු එක බැගින් දක්වා එම ගැටලු විසීමට ඔබ කරන යෝජනා තුන බැගින් දක්වන්න.

(2) (I) වර්තමානයේ නාගරික ප්‍රදේශවල 'බොවන ' හා 'බෝ නොවන' රෝග බහුල බව වාර්තා වේ.
(a) බොවන රෝග
(b) බෝ නොවන රෝග දෙකක් බැගින් දක්වන්න.

(II) ඔබ දක්වන ලද රෝග තත්වයන් අවම කර ගැනීම සඳහා ගත හැකි පියවර දෙක බැගින් වෙන වෙනම දක්වන්න.

## පිළිතුරු

(1)

| ආර්ථික ගැටලු | සමාජීය ගැටලු |
|---|---|
| දර්ද්‍රතාවය | සෞඛ්‍ය පිරිහීයාම |
| සේවා වියුක්තිය | යටිතල පහසුකම් වල ඌනතාවය |
| ඉඩම් මිල ඉහළ යාම | සංස්කෘතික පරිහානිය |

| ආර්ථික ගැටලු සඳහා විසඳුම් යෝජනා | සමාජීය ගැටලු සඳහා විසඳුම් යෝජනා |
|---|---|
| ජනයා නගරයෙන් බාහිර ප්‍රදේශවල පදිංචි කරවීම. | ජනතාව දැනුවත් කිරීම. |
| ස්වයං රැකියා සඳහා පුහුණු කිරීම හා යොමු කිරීම. | සෞඛ්‍ය පහසුකම් පුළුල් කිරීම. |
| සුභ සාධක සේවා පුළුල් කිරීම. | පහසුකම් ඇති ප්‍රදේශවලට ජනයා පදිංචි කරවීම. |

(2) (I) (a) ඩෙංගු,බරවා,පාචනය

(b) පිළිකා,දියවැඩියාව,අම්ල පිත්ත රෝගය

(II)

| බෝවන රෝග අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග | බෝ නොවන රෝග අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග |
|---|---|
| සෞඛ්‍ය පහසුකම් පුළුල් කිරීම. | අයහපත් සෞඛ්‍ය පුරුදු අවම කර ගැනීමට දැනුවත් කිරීම. |
| ජනතාව දැනුවත් කිරීම. | සෞඛ්‍ය පහසුකම් පුළුල් කිරීම. |
| පිරිසිදු ජලය ලබා ගැනීමට පහසුකම් ඇති කිරීම. | ප්‍රජා සෞඛ්‍ය අධ්‍යාපනය පුළුල් කිරීම. |

- ආදර්ශ පිළිතුරකි.



Copyright © www.e-thaksalawa.moe.gov.lk